# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2084/63 – 2018 අගෝස්තු 17 වැනි සිකුරාදා – 2018.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/04/ඩබ්ලිව්/2016/04.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

රත්නාවලී මල්ලිකා ද ජෝන් මහත්මිය ඇතුළු සේවකයින් 7 දෙනා, අංක 45/2, දළදාවත්ත පාර, දකුණු තල්පිටිය, වාද්දුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, හෙද විදුහල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: අයිආර්/සීඕඑම්/04/ඩබ්ලිව්/2016/04.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

රත්නාවලී මල්ලිකා ද ජෝත් මහත්මිය ඇතුළු සේවකයින් 7 දෙනා, අංක 45/2, දළදාවත්ත පාර, දකුණු තල්පිටිය, වාද්දුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සේවය කළ රත්නාවලී මල්ලිකා ද ජෝත් මහත්මිය ඇතුළු පහත නම් සඳහන් සේවකයින් හත්දෙනා හට 1987.03.04 දින III ශ්‍රේණිය III පන්තියට, 1988.01.01 දිනට III ශ්‍රේණිය II පන්තියට 1991.01.01 දිනට III ශ්‍රේණිය I පන්තියට පෙරදාතම් කර ලබා දී ඇති උසස්වීම් වලට අදළ වැටුප් පියවරයන් නිවැරදිව පියවරෙන් පියවරට පිහිටුවා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

01. රත්නාවලී මල්ලිකා ද ජෝත් මිය.
02. එච්. ඩී. එන්. ඩී. සිරිවර්ධන මිය.
03. ජී. ටී. එම්. ඉන්ද්‍රානි තන්ත්‍රිගේ මිය.
04. බී. එම්. කේ. කරුණාරත්න මිය.
05. ජී. කේ. කේ. වීරසිංහ මිය.
06. අයි. එල්. හේරත් මයා.
07. ස්ටැන්ලි වීරසිංහ මයා.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08-1182

---

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2016/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

බී. එම්. ප්‍රදීප් මංජුල මහතා, අංක 105/5, තල්ගස්වත්ත, කුඹුක්මුල්ල, හකුරුවෙල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89 F, සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2016/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

බී. එම්. ප්‍රදීප් මංජුල මහතා, අංක 105/5, තල්ගස්වත්ත, කුඹුක්මුල්ල, හකුරුවෙල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කරන බී. එම්. ප්‍රදීප් මංජුල මහතාට විරුද්ධව ප්‍රවේශ පත්‍ර විෂමාචාරයක් පදනම් කර ගෙන 2014.09.29 වන දින පැවැත් වූ විනය පරීක්ෂණය හා ඊට අදාළව ලබාදුන් දඬුවම් යුක්තිසහගත ද? එසේ නොවේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08-1183

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.